# දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

# පුරප්පාඩු දැන්වීම

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත රියදුරන්ගේ සේවය ලබා ගැනීම

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව වෙත රියදුරන් (ලොරි සහ ට්‍රැක්ටර් ධාවනය කල හැකි) ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීමට අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කල යුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රම මිලදී ගැනීම්- රියදුරු" ලෙස සඳහන් කර 2023.06.21 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලුපාර, දෙහිවල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අදාල අයදුම් පත්‍රය www.dmmc.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක)

1. තනතුර - රියදුරු (ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත)
2. දීමනාව - වැඩකරන එක් දිනක් සඳහා රු.3000/- කි.
3. කායික සුදුසුකම් -
   I. අවම උස අඩි පහක් (5´) විය යුතුය.
   II. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.
4. වෘත්තීය සුදුසුකම් -
   I. බරවාහන රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතුයි. (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක්)
   II. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

5. පළපුරුද්ද -

රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතික මගින් සනාථ කල යුතුය)

6. වෙනත් සුදුසුකම් -

I. අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

II. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කල යුතුය. (දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් පදිංචිය සනාථ කල යුතුය.)

III. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

IV. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

7. බඳවා ගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් සේවකයින් පහත කොන්දේසිවලට යටත්ව සේවය සඳහා බඳවාගනු ලැබේ.

I. වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරා ගැනීම සිදු කෙරේ.

II. දිනකට අවම පැය 08ක කාලයක් (දිවා/රාත්‍රී) සේවයේ යෙදිය යුතුය.

III. පූර්ණ කාලීනව රාජකාරීන් හි නියැලිය යුතුය.

IV. මසක් තුල ඔබ වැඩ කරන දින ගණන සඳහා අදාල දීමනාව ඊළඟ මස පළමු සතිය තුලදී ගෙවීම් කරනු ලබයි.

V. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලබනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුයි.

VI. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් නියම කරනු ලබනු ලැබුවහොත්, ඇප කොන්දේසි වලට යටත්ව රු.10000/-ක ඇපයක් තැබීමට ඔබ බැඳී සිටිය යුතුයි.

VII. තෝරා ගනු ලබන සියළුම අයදුම්කරුවන් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සමග ගිවිසුමකට එළඹිය යුතුයි.

VIII. සම්මුඛ පරීක්ෂණයේ පදිංචියට අදාල පොලිස් ස්ථානය විසින් නිකුත් කල පොලිස් සහතිකයක් ඉදිරිපත් කල යුතුයි.

- අයදුම්පත් භාරගන්නා අවසාන දින වන **<u>2023.06.21</u>** දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- අදාල සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

**එම්.එම්.සී.කේ.කේ.මාන්නප්පෙරුම**
**නාගරික කොමසාරිස් සහ,**
**බලතල, කාර්යය, කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී**
**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව**
**ගාලු පාර, දෙහිවල.**